සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ව්‍යාපාර අධ්‍යයනය - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 - 31 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.

---

(01) භාණ්ඩ හුවමාරුව සමග ජනිත වූයේ,

(1) මුදල් භාවිතයයි. (2) වෙළඳාමයි. (3) නිෂ්පාදනයයි.
(4) වාණිජ්‍යයයි. (5) ව්‍යවසායකත්වයයි. (........)

(02) පහත සඳහන් දෑ අතුරෙන් වුවමනා ලෙස සලකනු ලබන්නේ,

(1) සන්නිවේදනයයි. (2) ප්‍රවාහනයයි. (3) අධ්‍යාපනයයි.
(4) රක්ෂණයයි. (5) සෞඛ්‍යයයි. (........)

(03) පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩ වර්ගීකරණයකට අයත් අයිතමයන් ය. පහසු භාණ්ඩ, සාප්පු භාණ්ඩ, විශේෂිත භාණ්ඩ, නොසෙවූ භාණ්ඩ එම භාණ්ඩ වර්ගීකරණය කුමක්ද?

(1) කල්පවතින භාණ්ඩ (2) කල් නොපවතින භාණ්ඩ (3) පාරිභෝගික භාණ්ඩ
(4) කාර්මික භාණ්ඩ (5) අන්තර් භාණ්ඩ (........)

(04) වාණිජ්‍යය සමකළ හැක්කේ,

(1) ප්‍රාථමික නිෂ්පාදනයටය (2) ද්විතීයික නිෂ්පාදනයටය. (3) තෘතීක නිෂ්පාදනයටය.
(4) වෙළඳාමටය. (5) උපකාරක සේවා වලටය. (........)

(05) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරයට අයත් බලවේග කිහිපයකි.

A - කළමනාකරුවෝ B - තරගකරුවෝ C - සේවකයෝ
D - ගනුදෙනුකරුවෝ E - අයිතිකරුවෝ F - විභව ව්‍යාපාරිකයෝ
G - සැපයුම්කරුවෝ

මේ අතුරෙන් ආසන්න පරිසරයට අදාළ බලවේග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, C, E, G (2) B, D, F, G (3) A, B, D, F
(4) B, D, E, G (5) B, C, F, G (........)

(06) ඍජු නිෂ්පාදනය යනුවෙන් අදහස් කරනුයේ,

(1) ගනුදෙනුකරුගේ ඇණවුම මත කෙරෙන නිෂ්පාදනයයි.
(2) ප්‍රාථමික නිෂ්පාදනයයි.
(3) වෙළඳපොල සඳහා කරන නිෂ්පාදනයයි.
(4) සිය පාරිභෝජනය සඳහා කෙරෙන නිෂ්පාදනයයි.
(5) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා මත කෙරෙන නිෂ්පාදනයි. (........)

(07) පහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදිතයක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) ප්‍රාග්ධනය (2) සේවා (3) අදහස්
(4) ස්ථාන (5) ක්‍රියාකාරකම් (........)

(08) ගෝලීයකරණය යනුවෙන් අදහස් වනුයේ,

(1) භෞතික වශයෙන් ලෝකය කුඩාවීමේ ක්‍රියාවලියයි.
(2) වෙළඳාම සඳහා රටවල් එකතුවීමේ ක්‍රියාවලියයි.
(3) ගෝලීය වශයෙන් එකම මුදල් ක්‍රමයක් භාවිතා කිරීමට දිරිගන්වන ක්‍රියාවලියයි.
(4) ලෝකයේ පවතින රටාවට එරෙහිව සටන් කිරීම සඳහා රටවල් වල වෘත්තීය සමිති ඒකරාශි වීමේ ක්‍රියාවලියයි.
(5) ගෝලීය වශයෙන් ව්‍යාපාර ආයතන අතර ඇති අන්තර් රැඳියාව හා අන්තර් සම්බන්ධතාවයේ ක්‍රියාවලියයි. (........)

(09) පහත සඳහන් ඒවායින් ව්‍යාපාරයක සූක්ෂම පරිසර සාධකයක් වන්නේ,

(1) ආර්ථික (2) සමාජ හා සංස්කෘතික (3) දේශපාලන හා නෛතික
(4) තරගකාරීත්ව (5) තාක්ෂණික (........)

(10) දැනට ශ්‍රී ලංකා රාජ්‍ය ආදායමට වැඩි දායකත්වයක් ලැබෙන බදු වර්ගය වනුයේ,

(1) ආදායම් බද්දය (2) නිෂ්පාදන බද්දය (3) එකතු කළ අගය මත බද්දය
(4) ආනයන බද්දය (5) ධන බද්දය (........)

(11) 'ලාභ ඉපයීමට අමතරව ස්වාභාවික හා මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා වූ ව්‍යාපාර වල දායකත්වය සමාජ වගකීමයි. මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ,

(1) පිලිපීනයයි. (2) බ්‍රසීලයයි. (3) තායිවානයයි.
(4) ශ්‍රී ලංකාවයි. (5) ඇමරිකා එක්සත් ජනපදයයි. (........)

(12) ව්‍යාපාරයන්හි සමාජ වගකීම්වල විනිවිද භාවය පෙන්නුම් කිරීම සඳහා සැකසී ඇති ප්‍රමිති අතරට අයත් නොවනුයේ,

(1) AA 1000 (2) SA 5000 (3) ISO 14000
(4) FISE (5) ISO 9000 (........)

(13) ප්‍රථම මිහිකත සමුළුව ආරම්භ කරනු ලැබූයේ,

(1) 1995 වර්ෂයේ ය. (2) 1997 වර්ෂයේ ය. (3) 1999 වර්ෂයේ ය.
(4) 1992 වර්ෂයේ ය. (5) 1996 වර්ෂයේ ය. (........)

(14) ව්‍යාපාරවල සමාජ වගකීම් සම්බන්ධයෙන් වැදගත් වන පාර්ශවයන්ට අයත් නොවන්නේ,

(1) සමාජයීය පරිසරයය. (2) පාරිභෝගිකයාය. (3) ආයෝජකයාය.
(4) තරගකරුවාය. (5) සේවකයාය. (........)

(15) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතට ඇතුළත් වන්නේ,

(1) පොලී හා මුදල් සැපයුම් පාලනයයි. (2) බදු හා ගාස්තු පාලනයයි.
(3) වර්තන විදයම් පාලනයයි. (4) ප්‍රාග්ධන වියදම් පාලනයයි.
(5) රාජ්‍ය ආදායම් හා වියදම් පාලනයයි. (........)

(16) පෞද්ගලීකරණ ප්‍රතිපත්තියේ අරමුණක් නොවන්නේ,

(1) රාජ්‍ය මූල්‍ය අඩුකිරීම (2) පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම
(3) කාර්යක්ෂමතාව නංවාලීම (4) ගනුදෙනුකරුගේ තෘප්තිය නංවාලීම
(5) රජයට තිබූ වගකීමෙන් ඉවත්වීම (........)

(17) ව්‍යාපාර ආචාර ධර්මයකි.

(1) ව්‍යාපාර මගින් රටේ රැකියා නියුක්තියට දායක වීම.
(2) පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීම.
(3) අයිතිකරුවන්ට සාධාරණ ඉපයීමක් ලබාදීම.
(4) සේවකයන්ගේ වෘත්තීයමය ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම.
(5) අනෙකුත් ව්‍යාපාර සමග සාධාරණව හා අවංකව තරග කිරීම. (........)

(18) පාරිභෝගිකයා වියදම් කරන මුදලට සැබෑ වටිනාකමක් ලබා ගැනීමට ක්‍රියා කිරීම යන්නෙන් ගම්‍ය වන්නේ,

(1) තොරතුරු දැනගැනීමේ අයිතියයි. (2) වන්දි ලබාගැනීමේ අයිතියයි.
(3) විචාරාත්මක දැනුවත්භාවයයි. (4) පාරිභෝගික අයිතීන් තහවුරු කරගැනීමයි.
(5) තෝරාගැනීමට ඇති හැකියාවයි. (........)

(19) මහ බැංකු වාර්තාවට අනුව නිෂ්පාදන සංයුතිය දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික (2) ගැලපුම්, පෙරලුම්, සේවා
(3) කෘෂි, කාර්මික, සේවා (4) මහා පරිමාණ, මධ්‍ය පාරිමාණ, සුළු පරිමාණ
(5) කේවල, හවුල්, සමාගම් (........)

(20) ව්‍යාපාර සඳහා මුදල් ණයට ගැනීම හා විකිණීම සම්බන්ධ වෙළඳපල වන්නේ,

(1) ප්‍රාග්ධන වෙළඳපලයි. (2) මුදල් වෙළඳපලයි. (3) ද්‍රව්‍ය වෙළඳපලයි.
(4) කොටස් වෙළඳපලයි. (5) ශ්‍රම වෙළඳපලයි. (........)

(21) නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමේදී අදාළවන නිෂ්පාදන සාධක වලට අයත් නොවන්නකි.

(1) භූමිය (2) ශ්‍රමය (3) මුදල්
(4) ව්‍යවසාය (5) දැනුම (........)

(22) ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ග කිරීමේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක නිර්ණායක භාවිත කරයි. එහිදී ප්‍රමාණාත්මක නිර්ණායකවලට අයත් නොවන්නේ,

(1) ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය (2) නිෂ්පාදන ධාරිතාවය
(3) භාවිත කරන කළමනාකරණ ශිල්ප ක්‍රම (4) යොදවාගන්නා සේවක සංඛ්‍යාව
(5) ස්ථාවර වත්කම්වල වටිනාකම (........)

(23) ව්‍යාපාර කෙරෙහි ඇල්ම දක්වන විවිධ පාර්ශවයන් විවිධ හේතු මත ව්‍යාපාර හා සම්බන්ධ වේ. උසස්වීම්, වැටුප්, දීමනා, සුභසාධන පහසුකම් යනාදිය අපේක්ෂා කරන පාර්ශවය වන්නේ,

(1) කළමනාකරුවන් (2) ණය හිමියන් (3) අයිතිකරුවන්
(4) සේවකයන් (5) ගනුදෙනුකරුවන් (........)

(24) දේශීය ආදයම් බදු දෙපාර්තමේන්තුව විසින් සෘජුවම අයකරන බද්දක් නොවන්නේ,

(1) රේගු බදු (2) සමාගම් බදු (3) ආදායම් බදු
(4) ප්‍රාග්ධනලාභ බදු (5) දේපොල පැවරීමේදී අය කරන බදු (........)

(25) ව්‍යාපාර කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා බලපාන නීතිරීති අතරින් සේවක නීති යටතට අයත් වන්නේ,

(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (2) ආහාර පනත
(3) කාර්යාල හා සාප්පු පනත (4) කිරුම් මිනුම් පනත
(5) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත (........)

(26) පාරිභෝගික කටයුතු අධිකාරී පනත පිහිටුවීමේදී අහෝසි වූ පනතකි.

(1) කිරුම් මිනුම් ආඥා පනත (2) ජාතික මිල කොමිසම

(3) සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත (4) ජාතික පාරිසරික පනත

(5) ආහාර පනත (........)

(27) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවල ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අයත් නොවන කාර්යයන් වන්නේ,

(1) ප්‍රමිති පිළියෙල කිරීම (2) ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය

(3) පරීක්ෂණාගාර සේවා (4) ISO තත්ත්ව සහතික නිකුත් කිරීම

(5) පාරිභෝගික අධ්‍යාපනයට මැදිහත් වීම. (........)

(28) ව්‍යාපාර සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා පිහිටුවා ඇති ආයතන අතරට අයත් නොවන්නේ,

(1) ශ්‍රී ලංකා මහ බැංකුව (2) වෙළඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය

(3) අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව (4) ආනයන අපනයන සංවර්ධන මණ්ඩලය

(5) කාර්මික සංවර්ධන මණ්ඩලය (........)

(29) ජංගම දුරකථනවලින් නික්මෙන තරංග නිසා සිදුවන අනතුරු වළක්වා ගැනීම හෝ පාලනය සම්බන්ධයෙන් ආචාර ධර්ම ඇතුළත් වන්නේ,

(1) අලෙවිකරණයට අදාළ ආචාර ධර්ම තුළය.

(2) නිෂ්පාදනයට අදාළ ආචාර ධර්ම තුළය.

(3) මූල්‍ය අංශයට අයත් ආචාර ධර්ම තුළය.

(4) මානව සම්පත් කළමනාකරණයට අදාළ ආචාර ධර්ම තුළය.

(5) බුද්ධිමය දේපළ සම්බන්ධ ආචාර ධර්ම තුළය. (........)

(30) රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහබැංකුව විසින් ක්‍රියාත්මක කරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වලට අයත් නොවන්නේ,

(1) විවිධ වෙළඳපල කටයුතු (2) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා

(3) විනිමය පහසුකම් සැපයීම (4) ප්‍රතිපත්ති පොලී අනුපාතිකය

(5) ප්‍රතිමූල්‍ය පහසුකම් (........)

(31) වාර්ෂිකව වාහන ආදායම් බලපත්‍ර අලුත් කර ගැනීමේදී එම ගාස්තු ගෙවිය යුතු ආයතනය වනුයේ,

(1) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව (2) පළාත් සභාව

(3) සුරාබදු දෙපාර්තමේන්තුව (4) ශ්‍රී ලංකා රේගුව

(5) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (........)

- **32 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(32) පුද්ගලයන්ගේ විශ්වාස, අගනාවන්, ප්‍රතිමාන .................................................... පරිසරයේ සාධක ලෙස හඳුන්වනු ලැබේ.

(33) ව්‍යාපාරයකට අදාළ ආචාර ධර්ම ලිඛිතව ප්‍රකාශයට පත්කල විට එය හඳුන්වනුයේ ...................................... ලෙසය.

(34) අන්තර්ජාලය උපයෝගී කරගෙන සිදුකෙරෙන ඕනෑම ව්‍යාපාර ක්‍රියාවලියක් හැඳින්වනුයේ ................................................ ලෙසය.

(35) පරිසරයට හානි නොවන ආකාරයෙන් කටයුතු කිරීම ව්‍යාපාරයක ................................................ කොටසක් ලෙස සැලකේ.

(36) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්බන්ධ කෙරෙන ඕනෑම අවස්ථාවක් ....................................... ලෙස හැඳින්වේ.

(37) අවසන් පාරිභෝගිකයාට භාණ්ඩ විකිණීම .................................................................................. ලෙස හඳුන්වයි.

(38) පුද්ගල ආදායම මත අයකරන බද්ද ................................................................................ බද්ද ලෙස හඳුන්වයි.

(39) ආයතනයක් කිසියම් නිෂ්පාදනයක පමණක් දිගින් දිගටම යෙදී සිටීනම් එය .................................................. ලෙස හැඳින්වේ.

(40) ව්‍යාපාර ආයතනයකට ................................................................................ සාධක පාලනය කළ නොහැකිය.

- **අංක 41 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) පාරිභෝගික භාණ්ඩ වර්ග හතරකට බෙදිය හැකිය. එම වර්ග හතර කවරේද?

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................

(42) ව්‍යාපාරයක බාහිර පරිසර බලවේග වලින් එකක් ලෙස ප්‍රජා පරිසරය යන්න දැක්විය හැකිය. සෙසු බලවේග හතර කවරේද?

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................

(43) මුදල් සැපයුම් වෙනස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාවිතා කරන උපකරණ 4 ක් නම් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

(44) සුළු පරිමාණ ව්‍යාපාරිකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු 4 කි.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

(45) ජාත්‍යන්තරව පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් හතරක් සඳහන් කරන්න.

1. ................................................................................................................................................
2. ................................................................................................................................................
3. ................................................................................................................................................
4. ................................................................................................................................................

The National e-learning Portal for The General Education

(46) පරමාර්ථවල ලක්ෂණ 4 ක් දක්වන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

(47) ව්‍යාපාර සංවිධානයක තිබිය යුතු පොදු ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

(48) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ සඳහන් වන වෙළඳුන් විසින් සිදුකරන වැරදි 4 ක් ලියන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

The National e-learning Portal for The General Education

(49) ව්‍යාපාර නිසා පරිසරයට වන හානි අවම කිරීමට රජයකට කළ හැකි කාර්යයන් 03 ක් ලියන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................

(50) වෙළඳපල තුළ පාරිභෝගිකයන් වෙනුවෙන් ඉදිරිපත් කරන නිෂ්පාදිත 4 ක් නම් කරන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ව්‍යාපාර අධ්‍යයනය - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. "ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, වෙළඳාම හා අනුබද්ධිත සියලු සේවා ව්‍යාපාර ලෙස අර්ථ දැක්විය හැකිය.

(i) ආයෝජකයින්ට ලාභ උපයා දීමට අමතරව ව්‍යාපාරවලින් වෙනත් ඇල්මැති පාර්ශවවලට ලැබෙන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න.

(ii) ඉහත වගන්තියේ ඇතුළත් පහත සඳහන් සංකල්පය පැහැදිලි කරන්න.

(අ) අවශ්‍යතා හා වුවමනා

(ආ) භාණ්ඩ හා සේවා

(iii) ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ කාර්යයන් හයක් සඳහන් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) නූතන ව්‍යාපාරවල දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ, කාර්ය විශේෂීකරණයයි. කාර්ය විශේෂීකරණයේ හිතකර ප්‍රතිඵල දෙකක් හා අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

(v) පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම සංකල්ප පැහැදිලි කරන්න.

(අ) සත්‍ය දෑ සන්නිවේදනය කිරීම

(ආ) අන් අයට හානි නොකිරීම

02. (i) රජයක ආර්ථික අරමුණු හතරක් නම්කරන්න. එම අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර හතරක් සඳහන් කරන්න.

(ii) (අ) ප්‍රමිතියක් යනු කුමක්ද?

(ආ) ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් රටකට අත්වන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න.

(iii) රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ග ලෙස ඍජු හා වක්‍ර බදු දැක්විය හැකිය. ඍජු බදු හා වක්‍ර බදු නිදසුන් සහිතව වෙන වෙනම පැහැදිලි කරන්න.

(iv) A හා B දෙදෙනා එකතුව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යති. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔවුන් අතර මත භේදයක් පැනනැගී ඇත.

1. ලාභ බෙදාගැනීමේ අනුපාතය
2. යෙදූ ප්‍රාග්ධනයට පොලී ලබාගැනීම.
3. සක්‍රීය හවුල්කරුවන් වැටුප් ලබාගැනීම.
4. සපයා ඇති ණය මුදලට පොලී ලබා ගැනීමට ඉල්ලුම් කිරීම.

හවුල්කරුවන් අතර පවතින ගිවිසුමේ මේ කරුණු සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නොවේ. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව මෙම අවස්ථාවේ හවුල්කරුවන් කටයුතු කළයුතු ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

(v) (අ) වරලත් ව්‍යාපාරයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) වරලත් ව්‍යාපාර සංවිධාන ක්‍රමය මගින් වරලත් හිමියාට සහ වරලත් ලාභියාට ලැබෙන ප්‍රතිලාභ තුන බැගින් වෙන වෙනම සඳහන් කරන්න.

03. (i) කළමනාකරුවකු හා ව්‍යවසායකයකු අතර වෙනස්කම් සැසඳීම් වගුවකින් පෙන්වන්න.

(ii) (අ) පොදු පිළිගැනීම හොඳ මුදලක ගුණාංගයකි. ගනුදෙනුවේදී පොදු පිළිගැනීමක් ඇතිවීමට නම් මුදල් තවත් ගුණාංග කිහිපයකින් යුක්ත විය යුතුය. එවැනි ගුණාංග හතරක් සඳහන් කරන්න.

(ආ) පහත දැක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.

1. ණය මුදල්
2. ව්‍යවහාර මුදල් (නියෝග මුදල්)

(iii) "බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුල්‍ය සමාගම් ලෙස ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ග කර දක්වයි.

(අ) අනෙකුත් මුල්‍ය ආයතනවලින් වාණිජ බැංකු වෙන් කර හඳුනාගන්නේ කෙසේද?

(ආ) ඉහත සඳහන් එක් එක් මුල්‍ය ආයතන වර්ග සඳහා නිදසුන් දෙක බැගින් සඳහන් කරන්න.

(iv) ජීවිත රක්ෂණය සහ සෙසු රක්ෂණ වර්ග අතර දැකිය හැකි වෙනස්කම් හයක් පැහැදිලි කරන්න.

(v) සන්නිවේදන මාධ්‍යයක් ලෙස විද්‍යුත් තැපැල ව්‍යාපාර ලෝකයේ බෙහෙවින් ජනප්‍රිය වී ඇත. මෙසේ විද්‍යුත් තැපැල ජනප්‍රිය වීමට හේතු පැහැදිලි කරන්න.

04. (i) (අ) ව්‍යාපාරයක සූක්ෂම පරිසර බලවේග නම් කර, ඒවා වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.

(ආ) පහත සඳහන් ඒවා පිළිබඳව කෙටියෙන් ලියන්න.

1. ශ්‍රී ලංකා ප්‍රමිති ලාංඡනය
2. පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

(ii) අවදානම් ආවරණය කිරීමක් රක්ෂණයෙන් සිදුවේ. එසේනම් ව්‍යාපාරිකයෙකුට ඕනෑම අවදානමක් රක්ෂණය කළ හැකිද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(iii) චෙක්පතකට සාමාන්‍ය රේඛනය යෙදීමට වඩා විශේෂ රේඛණය යෙදීමෙන් ලැබෙන ප්‍රතිඵල කවරේද?

(අ) ජාත්‍යන්තර වෙළඳාම තුළින් රටකට අත්කර ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(ආ) ජාත්‍යන්තර වෙළඳාමේ ව්‍යාප්තියට එරෙහිව බාධා දෙකක් සඳහන් කරන්න.

(iv) "විද්‍යුත් වාණිජ්‍යය තුළින් ව්‍යාපාරිකයාට සහ පාරිභෝගිකයාට පමණක් නොව සමස්ත සමාජයටම ප්‍රතිලාභ හිමි වේ. සමාජයට හිමිවන ප්‍රතිලාභ ගැන විමසීමක් කරන්න.

## II කොටස

05. (i) "භෞතික වශයෙන් පැවති වෙළඳපොල සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණයේ වර්ධනය නිසා වෙළඳපොල අවකාශය බවට පරිවර්තනය වෙමින් පවතී." සාකච්ඡා කරන්න.

(ii) (අ) 'ව්‍යාපාර ආචාර ධර්ම' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? පැහැදිලි කරන්න.

(ආ) නිෂ්පාදන, අලෙවි, මුල්‍ය, මානව සම්පත් යන ව්‍යාපාර ශ්‍රිත අතුරෙන් ඕනෑම දෙකකට අදාළ වන ආචාරධර්ම ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(iii) සමුපකාර ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් වුවද පෞද්ගලික අංශයේ සෙසු ව්‍යාපාරවලට සාපේක්ෂව ඊට අනන්‍ය වූ සුවිශේෂ ලක්ෂණ ඇත. එම සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

The National e-Learning Portal for The General Education

(iv) වර්තමානයේ ඉලෙක්ට්‍රෝනික් හා ඩිජිටල් තාක්ෂණය යටතේ බහුලව යොදාගන්නා සන්නිවේදන ක්‍රම තුනක් නම් කර කෙටි හැඳින්වීමක් කරන්න.

(v) (අ) වෙළඳ කලාපයක් යනුවෙන් කුමක් අදහස් කෙරේද?

(ආ) දැනට ක්‍රියාත්මක වෙළඳ කලාප දෙකක් නම් කර සාමාජික රටවලට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

06. (i) "වර්තමාන වෙනස්වන ලෝකයට නායකත්වය ලබාදිය හැක්කේ ව්‍යවසායකයින්ටය." ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) ව්‍යාවසායකත්වය තුළින් අත්වන පුද්ගල හා ආර්ථික ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න.

(iii) කාර්, වෑන්, බස්රථ, ලොරි, දුම්රිය යනාදී ප්‍රවාහන මාධ්‍යයන් සුලභ වූ පමණින් රටක ප්‍රවාහනය කාර්යක්ෂම වන්නේ යයි ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iv) (අ) වාචික සන්නිවේදන ක්‍රම නම්කරමින් වාචික සන්නිවේදනයේ ඇති වාසි සාකච්ඡා කරන්න.

(ආ) අවිධිමත් සන්නිවේදනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(v) ආනයන අපනයන වෙළඳාමේ දී භාවිතා කෙරෙන ලියකියවිලි කිහිපයකි. එම ලියකියවිලිවලින් අපේක්ෂා කරන්නේ කුමක්දැයි වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

(අ) නෞභාර පත්‍රය

(ආ) ණයවර ලිපිය

(ඇ) ප්‍රවස්ථාන සහතිකය

(ඈ) ආනයන සටහන්කරය

07. (i) ආයතනයක ගනුදෙනුකරුවන්, සේවකයින්, ආයෝජකයින් හා පොදු පරිසරය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සමාජ වගකීම් සංකල්ප යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ii) 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සංස්ථාගත කිරීමේ සහතිකයෙහි අඩංගු වන තොරතුරු කවරේද?

(iii) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් යනු කුමක්ද? එවැනි ගිණුම් පවත්වාගෙන යාමෙන් ගිණුම් හිමියන්ට සහ ශ්‍රී ලංකා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම සඳහන් කරන්න.

(iv) රක්ෂණ මූලධර්ම ලෙස සැලකෙන රක්ෂණ හිමිකම උපරිම විශ්වාසය සහ ආසන්නතම හේතුව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(v) අතර මැදියන් රහිතව භාණ්ඩ බෙදාහැරීම තුළින් නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට අත්වන වාසි හා අවාසි වෙන වෙනම සඳහන් කරන්න.